**කම්ටු පත්‍රිකා 2015/05**

**සමුපකාර සමිති විසින් තැන්පත්කරුවන්ට ගෙවන පොලිය මත රඳවා ගැණුම් බදු අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීම.**

විවිධ සේවා සමුපකාර සමිති ග්‍රාමීය බැංකු, සණස සමිති ඇතුළු සියළුම මූලා සේවා සමුපකාර සමිති, තැන්පත්කරුවන්ට තැන්පත් පොළී ගෙවීමේ දී හෝ එම ගිණුම් වලට බැර කිරීමේ දී පහත සඳහන් පරිදි රඳවා ගැණුම් බදු අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කල යුතුය.

**02.** සමුපකාර සමිති විසින් තැන්පත්කරුවන්ට ගෙවන / බැර කරන පහත සඳහන් තැන්පත් පොළී රඳවා ගැණුම් බදු වලින් නිදහස් කර ඇත.

**2.1. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ගෙවන තැන්පත් පොළී**

2015.04.01 දින හෝ ඉන්පසු ආරම්භ වන තක්සේරු වර්ෂයක පළමු දිනට වයස අවුරුදු 59 සම්පූර්ණ වී ඇති තැන්පත්කරුවන්ට (ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට) ගෙවන / බැර කරන තැන්පත් පොළිය

**2.2. 1972 අංක 05 දරණ සමුපකාර සමිති පනත යටතේ හෝ පලාත් සමුපකාර ප්‍රඥප්ති යටතේ ලියාපදිංචි කර ක්‍රියාත්මක වන සමුපකාර සමිති තැන්පත් වෙනුවෙන් ගෙවන පොළිය / බැර කරන පොළිය**

**2.3. පුද්ගලයන්ගේ හා පුණ්‍යායතන වල ඉතුරුම් ගිණුම් සඳහා උපචිත වන පොළිය**

යම් පුද්ගලයෙකුගේ හෝ පුණ්‍යායතන ඉතුරුම් තැන්පත් වලට උපචිත වන පොළී ආදායම්,මාසිකව රු.5000.00 වඩා අඩු නම්,එම තැන්පත් පොළිය

**03.** සමුපකාර සමිති විසින් ගෙවනු ලබන / බැර කරනු ලබන අනෙකුත් තැන්පත් පොළී වලින් පහත සඳහන් පරිදි රඳවා ගැණුම් බදු අඩු කළ යුතුය.

**3.1.** 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 05 වගන්තියේ සඳහන් පුරවැසියන් ඇතුළුව පුද්ගලයන්ගේ හවුල් ව්‍යාපාර වල, පුණ්‍යායතන වලට ගෙවන / බැර කරන පොළී ආදායම් සඳහා 2.5% අනුප්‍රමාණය මත රඳවා ගැණුම් බද්ද

**3.2.** ලියාපදිංචි සමාගමකට ගෙවන / බැර කරන තැන්පත් පොළියෙන් 10% අනුප්‍රමාණය මත රඳවා ගැණුම් බද්ද

**3.3.** සමිති, සමාජ ශාලා ඇතුළු පුද්ගල මණ්ඩල සඳහා ගෙවන / බැර කරන පොළියෙන් 8% අනුප්‍රමාණය මත රඳවා ගැණුම් බද්ද

**3.4.** රඳවා ගැනීම් බදු අඩු නොකල යුතු බවට හෝ අඩු අනුප්‍රමාණයකින් රඳවා ගැණුම් බදු අඩු කල යුතු බවට දේශීය ආදායම් කොමසාරිස්වරයාගෙන් විධානයන් ලබා ගෙන සමිතියට ඉදිරිපත් කර ඇති තැන්පත්කරුවන්ට ගෙවන / බැර කරන පොළියෙන් රඳවා ගැණුම් බදු අඩු කිරීම එම විධානය පරිදි විය යුතුය.

04. මේ අනුව සියළුම මූල්‍ය සේවා සමුපකාර සමිති දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රඳවා ගැණුම් බදු අංශයෙන් ලියාපදිංචි වී ඉහත සඳහන් පරිදි තැන්පත් පොළියෙන් රඳවා ගැණුම් බදු අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කල යුතු බව සඳහන් කරමි.

05. මෙතෙක් තැන්පත්කරුවන්ගෙන් ලබා ගත් ලිඛිත ප්‍රකාශ මින් ඉදිරියට ලබා ගැනීමට අවශ්‍ය නොවන බව සඳහන් කරමි.

06. මේ සම්බන්ධ විස්තරාත්මක උපදෙස් පත්‍රිකාවක් ඉදිරියේ දී ලබා දෙන බව වැඩි දුරටත් සඳහන් කරමි.

07. පාර්ලිමේන්තුව මඟින් අනුමත කරන ලද 2015 අයවැය සහ 2015 අතුරු අයවැය මගින් ප්‍රකාශිත පරිදි 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 133 වන වගන්තියට අදාල විධි විධාන 2015 අප්‍රේල් 01 දින සිට බල පැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් 2015.04.07 දිනැති පුවත්පත් නිවේදනය මඟින් සියලුම මූල්‍ය ආයතන දැනුවත් කර ඇත එම පුවත්පත් නිවේදනයේ පිටපතක් මෙයට යා කර ඇත.

උපුල් ශාන්ත ද අල්විස්
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්